**කරච්චි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිගේ වාර්තාව 2017 ජූලි 18 වන දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

අවස්ථා 01කදී රු.865,325ක ආදායම් සහ රු. 1,214,986 ක වියදම් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වා තිබුණි.

1.3.2 විවිධ ණයහිමියෝ
--------------------

2015 වර්ෂයේදී කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ වෙන්කරන ලද රු. 9,848,967 ක් 2016 වර්ෂය දක්වා නිම නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදලට මාරුකර තිබීම නිසා එම මුදලින් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් සභාව විසින් තම රාජකාරී කටයුතු නියමිත ආකාරයෙන් ඉටුකර නොමැති බව නිරීක්ෂණය කෙරේ.

1.3.3 සේවක ණය
---------------

සේවක ණය හා අත්තිකාරම් වෙනුවෙන් සේවකයින් 08 දෙනෙකුට ප්‍රවර්ථන වර්ෂයේදී ලබා දුන් ණය මුදලට අදාළ රු. 376,869 ක් වටිනා ණය වාරික හා පොළිය අයකර ගෙන නොතිබුණි.

1.3.4 ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු ණය
----------------------------------------------------------------------

ශේෂ පත්‍රයෙහි දක්වා ඇති ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 2,274,789 ක ණය වටිනාකම තහවුරු කිරීමට අවශ්‍ය ගිවිසුම් සහ එම මුදල් යොදාගෙන කරනු ලැබූ ව්‍යාපෘති හා වැඩ කටයුතු පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරිණි. තවද මෙම ශේෂය වර්ෂ 07 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන වල දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණු අතර නිරවුල් කිරීමට කිසිදු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගනනයේදී අනාවරණය විය.

| නීති, රීති , රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1988 **ප්‍රාදේශීය** සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයෙහි IX වන පරිච්ඡේදයෙහි 180 වැනි රීතිය | මුදල් හා ගබඩා කටයුතු භාරව කටයුතු කරන නිළධාරීන්ගෙන් ඇපකර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | කල් ඉකුත් වූ එකතුව වූ රු. 809,597 ක තැන්පතු 22 ක් සම්බන්ධයෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක් සිට කිසිදු පියවරයන් සභාව විසින් ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 67,364,113 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 49,948,805 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු. 17,415,308 කින් වර්ධනය වී තිබුණි.

2.2 ආදායම් කළමණාකරණය

2.2.1 අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රවර්ථන වර්ෂයට අදාල අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | |
|---|---|---|---|
| ආදායම් අයිතමය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 150,000 | - | - |
| බදු කුලී හා ලීසිං | 33,958,960 | 33,096,769 | 4,757,122 |
| බලපත්‍ර ගාස්තු | 6,019,700 | 5,705,812 | - |
| අනෙකුත් ආදායම් | 71,512,136 | 88,701,095 | 28,968,874 |
| | 111,640,796 | 127,503,676 | 33,725,996 |

2.2.2 වරිපනම් හා බදු

------------------

1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයහි III පරිච්ඡේදයෙහි රීති අංක 32 ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු සඳහා ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වරිපනම් බදු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

ආදායම් ණයගැති ගිණුමෙහි පෙන්වනු ලබන රු. 4,757,122 ක් වටිනා ශේෂ 20 ක් වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් පුරා අය නොවී පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 සේවක පුරප්පාඩු

------------------

සභාවෙහි කම්කරු සේවක පුරප්පාඩු 17 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

3.2 සභාව විසින් ඉටු කරනු නොලැබූ ව්‍යාපෘති

-----------------------------------------------

ඉකුත් වර්ෂ වලට අදාලව අයවැය මඟින් වෙන්කරන ලද රු. 9,848,967 ක් වටිනා ව්‍යාපෘතීන් ප්‍රවර්ථන වර්ෂයේදී ද ඉටු නොකිරීම මත එම ශේෂය විවිධ ණයහිමි ගිණුමෙන් සමුච්චිත සංචිත අරමුදල් ගිණුමට මාරු කර තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

------------------

සභාව සතු රු. 5,190,000 ක් වටිනා හයිඑස් වාහනය 2014 ජූලි 17 වන දින අනතුරකට පත්ව තිබූ අතර එහිදී සිදුවූ අලාභය රු. 1,214,986 ක් විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව මූලික විමර්ෂණයක් සිදුකර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(2) ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි. එසේම මෙම වාහනය අළුත්වැඩියා කිරීමට රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර තිබූ බැවින් එහි අළුත්වැඩියා පිරිවැය සභාව විසින් දරා ඇති බව නිරීක්ෂණය විය.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශය තුල එකතු වන කුණු ගිණි තබා විනාශ කිරීම හා පස් දමා වසා දැමීම ආදී කටයුතු පමණක් සභාව විසින් සිදුකරන අතර කොම්පෝස්ට් පොහොර සෑදීම හා අපද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීම් යන ආදී ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු සිදු කිරීමට සභාව විසින් කිසිඳු පියවරයක් ගෙන නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

--------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැය ඇස්තමේන්තු නිසි ආකාරයෙන් සකස් කර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායමත් තත්‍ය ආදායමත් අතර රු. 15,862,880 ක වෙනසක් දක්නට ලැබුණු අතර අයවැයගත වියදමක් තත්‍ය වියදමත් අතර රු. 16,006,173 ක වෙනසක්ද දක්නට ලැබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

i. හිඟහිටි ආදායම් අයකර ගැනීම
ii. වාහන භාවිතය
iii. කොන්ත්‍රාත් පරිපාලනය
iv. ආදායම් ලේඛණ නඩත්තුව
v. කම්කරුවන් අධීක්ෂණය